# චූටි දුවයි පූසෝ තුන්දෙනයි



දිසෙන්දි සෙහස්නා මාවිල්මඩගේ

# චූටි දුවයි
# පූසෝ තුන්දෙනයි

## දිසෙන්දි සෙහස්නා මාවිල්මඩගේ

කතෘ

කතෘගේ වෙනත් කෘති

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
3-E ශ්‍රේණිය
2026.05.10

ISBN-978-624-208-998-0

# පිදුම

මට මේ පොත ලියා නිම කිරීමට,
මාව දිරිමත් කළ මගේ සෙවණැල්ල වගේ
මා පිටුපස සිටින අම්මාටත්, තාත්තාටත්,
මහාමායා විදුමව් සෙවණේ.
මට සිප්සතර කියාදෙන
මගේ පන්තිභාර
ගුරුමෑණියන්ටත්,
ඒවගේම
මගේ ආදරණීය
අයියලා දෙන්නාටත්
මගේ මේ පොත
ආදරයෙන් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව


2026.05.10

# චූටි දුවයි පූසෝ තුන්දෙනයි

එකමත් එක දවසක ලස්සන හිම්දිරි උදෑසනක කුරුල්ලෝ සිංදු කියනකොට චූටි දූ අවදි වෙලා වටපිට බැලුවා.

අනේ අද මම නැගිටින්න පරක්කු වෙලා. අද නිවාඩු දවසක් නිසා මට නින්ද ගිහිං.

කුරුළු යාලුවෝ තමයි මාව නැගිට්ටුවේ කියලා චූටි දුවට හිනාගිය.

චූටි දුව ඉක්මණට නැගිටලා අම්මා ළඟට දුවලා ගිහිං අම්මා ගාව හුරතල් උනා.

හා..... හා...... අද මගේ චූටි දූට නින්ද ගියා නේද? කියලා අම්මා චූටි දුව ආදරෙන් බදා ගත්තා.

චූටි දූට ලැජ්ජා හිතිලා දුවලා ගිහිං මුහුණ සෝදලා, බුදුන් වැන්දා.

චූටි දූ උදේ කෑම කන්න හදන කොටම චූටි දූගේ යාලුවෝ තුන් දෙනා චූටි දූ ළඟට දුවගෙන ආවා.

කවුද දන්නවාද චූටි දූගේ යාලුවෝ තුන්දෙනා. එයාලා තමයි චූටි පූස් ලොකු පූස් සහ කිරී.

චූටි පූස් දඟයා, ලොකු පූස් අහංකාරයි, කිරී නම් අහිංසකයා.

ඔන්න ඉතිං දැං චූටි දූට කෑම කන්න දෙන්නේ නෑ.

මෙයාලා ඤාවි ඤාවි ගගා කකුල් ළඟ දැවටෙනවා. චූටි දූ ඉක්මනට එයාලටත් කෑම දීලා චූටි දූ කන්න පටන් ගත්තා.



හවස් වෙලා චුටී දූ ටිකක් සෙල්ලම් කරන්න මිදුලට ආවා. චූටි දූ එක්ක සෙල්ලම් කරන්න එහා ගෙදර සෙව්වන්දි නංගිත් ආවා. සෙව්වන්දි නංගි ආවේ එයාගේ ගෙදර ඉන්න පූස් පැටියාවත් අරගෙන.

ඉතිං චූටි දූයි සෙව්වන්දි නංගියි සෙල්ලම් කර කර ඉන්න කොට සෙව්වන්දි නංගිගේ පූස් පැටියත් චූටි දූගේ චූටි පූස් එක්ක සෙල්ලම් කළා. මේ වෙලාවේ එක පාරට මහ වැස්සක් කඩාගෙන වැටුණා.



චූටි දූයි, සෙව්වන්දි නංගියි ගෙට දිව්වා. මේ දෙන්නාටම පූස් යාලුවෝ අමතක උණා.

ටිකක් වෙලා ගියාට පස්සෙයි දෙන්නාටම පූස් යාලුවෝ මතක් උනේ. යාලුවෝ දෙන්නා කූඩයක් අරගෙන පූස් යාලුවෝ හොයන්න යන්න හදන කොටම සෙව්වන්දි නංගිගේ පූස් පැටියා දොර ළඟ ඉදලා ඤාව් කිව්වා. ඒත් චූටි දූගේ දඟයානම් පේන්න හිටියේ නෑ.

චූටි දූ චූටි පූස්ව හැම තැනම හෙව්වා.

අනේ.... චූටි පූස් ඔයා කොහේද?
චූටි පූස් නෑ

චූටි දුවගේ ඇස් වලට කඳුලු ආවා.
මගේ චූටි පූස්.....

ලොකු පූස් සහ කිරී දුව ලඟට ඇවිත් මියෑව් කියලා දුවව සැනසුවා. චූටි දූ කුඩයක් අරගෙන චූටි පූස්ව හොයන්න ගියා.

චූටි පූස් ඔයා කොහේද?
ගෙදර පාරේ අගටම ගියාම මියාව් සද්දයක් ඇහුණා බැලුවාම පෙට්ටියක් ඇතුලේ චූටි පූස් බයවෙලා හිටියා. චූටි පූස් කියලා චූටි දූ එයාව වඩාගත්තා.

ගෙදර ආවාම ලොකු පූස් සහ කිරිත් චූටි දුවගේ වටේ දුවන්නට පටන් ගත්තා.

එයාලා තුන්දෙනා ආයෙත් එකට. සෙව්වන්දි නංගියටත් හරි සතුටුයි පූස් පැටියා හම්බඋනු එකට.

රාත්‍රියේ චූටි දුව ඇඳට ගියා. පූස්ලා තුන්දෙනාත් එයා ළඟට ආවා.

මම ඔයාලට ගොඩක් ආදරෙයි.





# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN-978-624-208-998-0